# දකුණු ඉවුර - வலது பிரிவு - Right Bank

පුද්ගලික සහ වෙළෙඳපොළ නිදහස වෙනුවෙන් වූ සිවිල් ව්‍යාපාරය

ඔක්තෝබර් 4, 2025

හිතවත් ප්‍රවෘත්ති කර්තෘ/අධ්‍යක්ෂ තුමා/තුමිය,

## දකුණු ඉවුරේ - මාධ්‍ය නිවේදනයයි

පසුගියදා **කර්මාන්ත අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති** මහතා බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පැවැත්වෙන කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී **දකුණු ඉවුර සාමූහිකයේ** ජ්‍යෝෂ්ඨ සාමාජිකාවක් වන **අරුණි ශපීරෝ** විසින් රචිත **"ඇඩම් ස්මිත් සහ ජාතීන්ගේ ධනය"** අතැතිව සරනු දක්නට ලැබිණි.

ශ්‍රී ලංකාවේ ප්‍රබලම මාක්ස්වාදී වාමාංශික පක්ෂයේ දේශපාලනය කර මේ වනවිට රාජ්‍ය පාලනයේ සිටින පුද්ගලයෙකු ලෙස තමන්ගේ ප්‍රතිවාදී කඳවුරේ දක්ෂිණාංශික ආර්ථික දැක්ම සහ ලෝකයේ ආර්ථික විද්‍යාවේ පියා ලෙස සලකන ඇඩම් ස්මිත් අධ්‍යනය සඳහා ඔහු දක්වන උනන්දුව දකුණු ඉවුර ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම දක්ෂිණාංශික දේශපාලන සංවාද මණ්ඩපය ලෙස අගය කරන්නෙමු.


එමෙන්ම පූර්වයේ ශ්‍රී ලංකාවේ දේශපාලන නායකයන් කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සහභාගී වෙමින් මෙරට මුද්‍රණ සහ ප්‍රකාශන කර්මාන්තයට දැක්වූ සංකේතාත්මක සහය ඉදිරියට පවත්වාගෙන යාම ගැන ද ධනවාදී ආර්ථික මොඩලයක් යෝජනා කරන අපගේ ප්‍රාසාදයට ලක්වූ බව සඳහන් කරනු කැමැත්තෙමු. එමෙන්ම ඇඩම් ස්මිත් කියවීමෙන් ලැබෙන වෙනස් මානයන් රටේ ජාතික ප්‍රතිපත්ති සඳහා ඉවහල් වනු ඇතියි අපි උදක්ම බලාපොරොත්තු වමු.

ස්තුතියි.


ශාලිත කැමරූන් (මාධ්‍ය ප්‍රකාශක)
(075) 496 1921

ක්‍රිෂ්ණා රාමනායක (විධායක අධ්‍යක්ෂ)
(072) 361 4298

දකුණු ඉවුර
ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම න්‍යායාත්මක දක්ෂිණාංශික සංවාද මණ්ඩපය




facebook.com/pfbid0PFXM8gpJNx6pGyqPdkTtZVwNxJoQ2Gr
b3dtpmCoVLEXPf5phQTBbDh2VnwTAVBLGl